# චීනයේ තාඕ දහම හා කොන්ෆියුසියස් දහම පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක්

එස්. නිමාලි ප්‍රියංගිකා

Boarded by the Tibet Plateau from the West and the Pacific Ocean from the East and expanded in an area of 10 million $km^{2,}$ the Chinese civilization is undoubtedly the base of different beliefs and cultures. The main purpose is here to analyze the Tao and Confucius Philosophy. The religious renaissance that took place in China around 06 B.C. mainly revolved around the era of Laotze (Laozi) and Confucius (Kongzi) the two Philosophers who nourished Chinese Culture. Philosopher Laotze laid emphasis on the natural flow of Chinese philosophy whereas Confucius on the practical path. Confucius is a behaviorist who made spiritual education his main theme and Laotze based his Philosophy on the functioning of the universe. The secondary data collected here is from books, magazines, government publications, internet sources and newspaper articles.

© එස්. නිමාලි ප්‍රියංගිකා

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර, දිනේෂ් සඳරුවන්
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

ලොව පැරැණි රාජ්‍ය අතුරින් එකක් වන චීනය ඉපැරැණි ශිෂ්ටාචාරයකට ද උරුමකම් කියයි. වාර්තා ගත තොරතුරු අනුව වසර 4000ක පමණ පැරැණි ඉතිහාසයක් චීනය සතු ව ඇත. චීනයේ රාජ වංශ යුගය ආරම්භ වූයේ ක්‍රි.පූ. 2070 වසරට ආසන්න යුගයක දී යැ යි ඉතිහාසයේ සඳහන් ව ඇත.[1] ඒ රාජ පරම්පරා යටතේ චීනයේ පැවැතියේ වැඩවසම් සමාජයක වූ රාජාණ්ඩු ආධිපත්‍යය යි. මේ අනුව එහි ජන සම්භවය හා ශිෂ්ටාචාරයේ ආරම්භය පිළිබඳ විවිධ විචාර දක්නට ලැබේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ දී චීනයේ ආගම් ඇදැහිලි පිළිබඳ කරුණු විචාරයේ දී දෙවියන් වහන්සේ පිළිබඳ විශ්වාස තිබුණි. අධිරාජ්‍යයක පැවැත්ම, සමෘද්ධිය හෝ පරිහානිය සම්පූර්ණයෙන් ම රඳා පවතින්නේ අධිරාජ්‍යය විසින් දෙවියන් වහන්සේ උදෙසා පවත්වනු ලබන ආගමික පුද පූජා අනුව බව පිළිගැනීම විය. කෙසේ වෙතත් ක්‍රිස්තු පූර්ව හ වැනි ශත වර්ෂය චීන ආගමික ඉතිහාසයෙහි නව යුගයක උදාව ලෙස සැලැකිය හැකි ය. ශත වර්ෂ 20ක් මුළුල්ලේ චීන සංස්කෘතිය පෝෂණයෙහි ලා විශාල බලපෑමක් ඇති කළ මහා චීන දාර්ශනිකයන් දෙ දෙනකු වන ලාඕත්සතුමා (Laozi) හා කොන්ෆියුසියස්තුමාගේ (Kongzi) උපත සිදු වූයේ මේ යුගයේ දී ය. මේ දෙ දෙනා උසස් ආගමික ශාස්තෘහු ලෙස ගෞරවයට පාත්‍ර වී සිටිති.

කොන්ෆියුසියස්තුමාට අවශ්‍ය වූයේ චීනයට නව ආගමික දර්ශනයක් ඉදිරි පත් කිරීම නො වේ. බිඳ වැටෙමින් පැවැති දේශපාලන සමාජ සංස්ථා පුනරුත්ථාපනය කිරීම ඔහුගේ මූලික අභිප්‍රාය විය. ඔහුගේ ඉගැන්වීම් කේන්ද්‍ර වූයේ පුද්ගල සදාචාරයෙන් සමාජ සදාචාරය ගොඩනැංවීම යි. මානව දයාව, ධාර්මිකබව හා යුක්තිගරුකබව යන සදාචාර ධර්ම පාලකයන් අතර ඇති කිරීමෙන් සාමකාමී සමාජයක් බිහි කිරීම ඔහුගේ පරමාර්ථය විය. සදාචාරය පිළිබඳ ඉගැන්වීම මූලික තේමාව කරගත් මොහු චර්යාවාදියකු ලෙස සැලැකිය හැකි ය. මොහුගේ සම කාලීනයකු වූ ලාඕත්සතුමා විශ්ව ක්‍රියාකාරිත්වය පිළිබඳ "තාඕ" නැමැති දර්ශනය ඉදිරි පත් කළේ ය. තාඕ යනු විශ්ව ක්‍රියාකාරිත්වය සිදු වන මූල ධර්මය යි. ස්වභාව ධර්මය තමාට ඇවැසි ආකාරයට සකසාගැනීම නො ව එහි ජීවත්

වීමට තාඕ දහම මඟ පෙන්වයි. ඒ සදහා ආචාර ධර්ම අවශ්‍ය නො වේ. මොහුගේ ඉගැන්වීම් චීන දර්ශනයේ ස්වභාවික ගමන් මඟ පිළිබිඹු කළේ ය.

චීන ආගමික ඉතිහාසයේ ක්‍රිස්තු වර්ෂ පළමු වැනි ශත වර්ෂය ඉතා වැදැගත් තැනක් හිමි කරගනී. මෙතෙක් පැවැති දේශීය ආගමික හා දාර්ශනික සම්ප්‍රදායය විදේශීය බලපෑමට හසු වීම මේ යුගයේ දී සිදු විය. චීන සංස්කෘතිය නව මං පෙතකට යොමු කිරීමට හා පෝෂණය කිරීමට ඉවහල් වූ බුදු දහම හඳුන්වාදීම මෙකල සිදු වූ බව පිළිගැනේ.[2] බුදු දහම ක්‍රම ක්‍රමයෙන් චීන ජන ජීවිතයට පිවිසි අතර කාලයත් සමඟ එය අනෙකුත් දේශීය ආගම් හා සම තත්ත්වයට හෝ දේශීය ආගම් අබිබවා නැඟී සිටියේ ය. බුදු දහම ක්‍රම ක්‍රමයෙන් පොදු ජනතාව අතර මෙන් ම පාලකයන් අතර ජනප්‍රිය වූ අතර මෙය දේශීය ආගම්වලට මහත් තර්ජනයක් විය. මේ නිසා බුදු දහමට එරෙහිව විවිධ අවස්ථාවල බලවේග ඉස්මතු විය. බුදු දහම විදේශීය ආගමක් ලෙස චීනයේ ව්‍යාප්ත වීමේ දී දේශීය ලක්ෂණ එයට ඇතුළත් විය. බුදු දහම දේශීය ආගමික සම්ප්‍රදාය අබිබවා ජනප්‍රිය වීමත් සමඟ දේශීය ආගම්වලට ඔවුන්ගේ පැවැත්ම සඳහා බුදු දහමේ ජනප්‍රිය අංග තම සම්ප්‍රදායට උකහාගැනීමට සිදු විය.

## තාඕ දහම

චීන ඉතිහාසයේ විශ්ව ක්‍රියාකාරිත්වය හා පුද්ගල චර්යාව පිළිබඳ "තාඕ" නැමැති දර්ශනය ඉදිරි පත් කළේ ලාඕත්සතුමා ය. චීන භාෂාවෙන් ඔහු (Laozi) නමින් හැඳින්විණ. ශාස්තෘවරුන්ගේ චරිතය පිළිබඳ විමසා බැලීමේ දී ඔහු ක්‍රි.පූ. 604 දී පමණ උපත ලබන්නට ඇතැ යි සැලැකේ. ඔහුගේ පෙළපත් නාමය "ලී" වේ. මොහු රාජ්‍ය ලේඛනාගාර පාලකයකු ලෙස සේවය කළ බවත් මහලු වියේ දී වෘත්තියෙන් සමුගෙන චීනය අත හැර බටහිර දෙසට ගිය බවත් සඳහන් වේ.[3] කෙසේ නමුත් මොහු තම දර්ශනය පැහැදිලි කිරීම සඳහා "තාඕ ත ජිං" (dàodéjîng) නමින් ග්‍රන්ථයක් රචනා කර ඇත. මේ ග්‍රන්ථය තාඕ දහමෙහි මූල ග්‍රන්ථය ලෙස හැඳින්වේ. මේ ග්‍රන්ථයෙහි අන්තර්ගතය හා ස්වභාවය සැලැකිල්ලට ගනිමින් එහි ඉන්දීය ආභාසයක් දක්නට ලැබෙතැ යි යන්න සමහරුන්ගේ

අවධානයට යොමු ව ඇත. අනෙක් අතට එහි විග්‍රහ කෙරෙන ඇතැම් කරුණු ඉන්දීය දර්ශනය හා සාම්‍යයක් ගත්ත ද ඔවුනොවුන්ගේ ඉගැන්වීම්වලට ආවේණික වූ අනන්‍යතා දක්නට ලැබේ. මේ ග්‍රන්ථය බොහෝ දෙනාගේ සම්භාවනාවට පාත්‍ර වී ඇත. දෙ වැනි හන් රජුගේ බිසව මේ ග්‍රන්ථය කෙරෙහි මහත් භක්තියක් දැක්වූ බව දැක්වේ.[4] ජින් අධිරාජ්‍යයා එය චීන සම්භාව්‍ය කෘතියක් ලෙස නම් කළේ ය. මෙහි අඩංගු කරුණු චීන සංස්කෘතිය පෝෂණයෙහි ලා විශාල බලපෑමක් කළ බැවින් චීන සම්භාව්‍ය කෘතියක් ලෙස සිය වස් ගණනාවක් මුළුල්ලේ ම සම්භාවනාවට පාත්‍ර වී ඇත.

"තාඕ" යන වචනය චීන දර්ශනයෙහි ගැඹුරු අර්ථ දෙන වචනයකි. එය යොදාගෙන ඇත්තේ "මාර්ගය" යන අර්ථයෙනි. පුද්ගලයාගේ කාර්යය විය යුත්තේ යථාර්ථය තේරුම්ගැනීම යි. අනෙකුත් ආගම්වල මෙන් තාඕ දහමෙහි පුද්ගලයා පසක් කරගත යුතු වූ හෝ එළැඹිය යුතු හෝ නිර්වාණය, මෝක්ෂය, ගැලවීම වැනි ඉලක්ක නිර්දේශ නො කරයි. "තාඕ" නමින් හැඳින්වෙන යථාර්ථය හා ඒකීයත්වයට පත් වීම හෙවත් තාඕ අවබෝධ කරගෙන ඒ අනුව ජීවත් වීම කළ යුත්තේ පුද්ගලයා ය. "තාඕ" සමග ව්‍යාප්තියට පත් වූ සියල්ලෙහි ප්‍රවර්ධනය වීමේ ජීව ගුණය පවතී. පුද්ගලයා තාඕ හා ඒකීයත්වයට පත් වීම යනු ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වය සමග ඒකීයත්වයට පත් වීම යි. මේ අනුව තාඕ දහම නිර්දේශ කරන්නේ උස් පහත් භූමි පසු කර නිදහසේ ගලා යන දිය පහරක් මෙන් ස්වභාව ධර්මයේ මාවත ඔස්සේ යෑම යි.

එහි දී පුද්ගලයා ආචාර ධර්මවල කොටු කිරීමක් නැත. මේ ගමන් මාර්ගයේ අවසානය වන්නේ ලෝකයේ ක්‍රියාකාරිත්වය සිදු වන්නේ කෙසේ ද යන්න පිළිබඳ සජීවී අවබෝධයක් ලබාගැනීම යි. ස්වභාව ධර්මය තමාට අවශ්‍ය ලෙස සකසාගැනීම නො ව එහි ජීවත් වීමටත් ස්වභාව ධර්මයෙන් තමා වෙන් කරගැනීමට නො ව ස්වභාව ධර්මයෙහි ජීවත් වීමටත් තාඕ දහම මග පෙන්වයි. ලාඕත්සතුමා ඉදිරි පත් කරන සදාචාරත්වයට පත් වීමේ මාර්ගය සරල වූවකි. ඔහුගේ ඉගැන්වීම වූයේ "සාන්තුබව ඉවත දමන්න,

ඉගැනීම ඉවත දමන්න, එවිට දුකක් නොවෙයි." යන්න යි. ඔහු රටේ පාලකයනට දුන් අවවාදය වූයේ "පාලනය කිරීමෙන් තොර ව පාලනය කරන්න" යන්න යි.

"තහනම් හා බාධක වැඩි වන්නේ ද මිනිස්සු අසරණ බවට පත් වෙති" හා "මිනිසුන් අත ආයුධ වැඩියෙන් ගැවසෙන්නේ ද රාජ්‍ය වියවුල් බවට පත් වේ"[5] වැනි ප්‍රකාශවලින් ඔහු අරාජික තත්ත්වයක් අපේක්ෂා කළේ යැ යි සිතිය නො හැකි ය.

ස්වභාව ධර්මයේ වෙනස් කළ නො හැකි ධර්මතා පවත්නා බවත් ඒ ධර්මතා අවබෝධ කරගෙන පුද්ගලයා තම චර්යාව සකසාගත යුතු බවත් ඔහු අදහස් කළේ ය. එසේ ම "සම්පත් විසින් සම්පත් විනාශ කරනු ලබයි"[6] යන්න තාඕ දහමෙහි එන වැදැගත් ඉගැන්වීමකි. මින් අදහස් කරන්නේ පුද්ගලයා ආශාවලට වහල් වීමෙන් රැස් කරගන්නා භෞතික සම්පත් හේතුවෙන් ඔහු සහජයෙන් උරුම කරගත් ආධ්‍යාත්මික සම්පත් විනාශ කරගන්නා බව යි. ලාඕත්සතුමා අනුව මිනිසුනට සම්පත් වැඩි වන්නේ ද එවිට දුක ද වැඩි වෙයි. ස්වල්පයක් ඇති විට මිනිසා පොහොසතකු වෙයි. බොහෝ සම්පත් අයත් කරගැනීමෙන් ව්‍යාකුලත්වයට පත් වන බව පැහැදිලි වේ.

## කොන්ෆියුසියස් ධර්මය

ක්‍රි.පූ. 552 දී උපත ලැබූ කොන්ෆියුසියස්තුමා මෙහි ආදි කර්තෘවරයා වෙයි. කොන්ෆියුසියස් ධර්මය අධ්‍යනය කිරීමේ දී ඔහුගේ ඉගැන්වීම්වලට පසුබිම් වූ සමාජ දේශපාලන පසුබිම කුමක් ද යන්න අවධානය යොමු කිරීම වැදැගත් ය. එකල චීනයේ පැවැති නොසන්සුන් දේශපාලන වාතාවරණය නිසා මොහු සමාජ දේශපාලන සාරධර්ම කෙරෙහි අවධානය යොමු කළේ ය. මෙහි දී පාලකයන් අතීත රාජ්‍ය පාලන මූල ධර්මවල පිහිටුවීමට අධ්‍යයනය හා අධ්‍යාපනය යන මාර්ගය සුදුසු බව ඔහු නිගමනය කළේ ය. අතීත සාර ධර්ම අධ්‍යයනයෙහිත්, ඒ සාර ධර්ම තරුණ පිරිස් අතර ඉගැන්වීමෙහිත් ඒවා ක්‍රියාවට නැගීමෙහිත් යෙදෙමින් සාමකාමී සමාජ දේශපාලන වාතාවරණයක් ඇති කිරීම සඳහා ඔහු සිය ජීවිතය කැප කළේ ය.

කොන්ෆියුසියස් දර්ශනය අනුව පුද්ගලයා හා සමාජ අතර සම්බන්ධතාවක් පවතී. පුද්ගල චර්යාව යහපත් වීමෙන් සාමකාමී සමාජ දේශපාලන වාතාවරණයක් ගොඩනැඟීමට හැකි බව ඔහු පිළිගත්තේ ය. හැම පුද්ගලයකු ම සාන්තුවරයකු මෙන් වූ මනා පෞරුෂයකින් යුක්ත විය යුතු ය. විශේෂයෙන් සමාජයේ ඉහළ පාලකයන්ගේ චර්යා සමාජය කෙරෙහි පුළුල් බලපෑමක් කරයි. එසේ ම පුද්ගල හා සමාජ අභිවෘද්ධිය සඳහා අදාළ වන ආචාර ධර්ම රැසක් ද ඇත. සමාජයෙන් තොර ව පුද්ලයාට හුදෙකලා ව ජීවත් විය නො හැකි බව කොන්ෆියුසියස් දහමේ වැදැගත් ඉගැන්වීමකි. පුද්ගල අවශ්‍යතා සීමා රහිත ය. ඒවා තනි පුද්ගලයකුට සපුරා ගත නො හැකි ය. එබැවින් අන් අයගේ සහාය ලබාගැනීමට අවශ්‍ය වේ.

ඒ ඒ සමාජ ඒකක අතින් ඔවුනොවුනට ඉටු විය යුතු යුතුකම් දක්වමින් ප්‍රධාන සමාජ සම්බන්ධතා පහක් එහි දක්වා ඇත.[7]

1. පාලකයා හා පාලිතයා අතර සම්බන්ධය
2. පියා හා පුතා අතර සම්බන්ධය
3. ස්වාමියා හා භාර්යාව අතර සම්බන්ධය
4. වැඩිමහල් සහෝදරයා හා බාල සහෝදරයා අතර සම්බන්ධය
5. මිත්‍රයා හා මිත්‍රයා අතර සම්බන්ධය

කොන්ෆියුසියස් ධර්මයෙන් සමාජ දර්ශනය පිළිබඳ ව පමණක් නො ව දේශපාලන දර්ශනය, රාජ්‍ය පාලන මූල ධර්ම ආදි අංශ පිළිබද කරුණු දැක්වේ. කොන්ෆියුසියස් ධර්මය අනුව රටක ප්‍රධානතම සම්පත වන්නේ එරට ජනතාව යි. ඒ අනුව රාජ්‍යත්වය වූකලි ජනතා පරමාධිපත්‍යය පදනම් කරගත්තක් බව කොන්ෆියුසියස් ධර්මය අනුව පැහැදිලි වේ. රාජ්‍ය පාලනයේ දී මෛත්‍රිය, ධාර්මික බව, යුක්තිගරුකභාවය හා පරාර්ථචර්යාව යන ගුණාංග පාලකයකු සතු ව තිබිය යුතු ය. මනා චරිත සංවර්ධනයක් ඇති කරගැනීම පාලකයකුට අවශ්‍ය ම අංගයකි. එසේ ම ඥාතීන් වෙත ආදරය දැක්විය යුතු ය. ශ්‍රේෂ්ඨ ඇමතිවරුනට ගරු කිරීම, සියලු ම නිලධාරීන් වෙත කරුණාව දැක්වීම ආදි ගුණාංග පාලකයකු සතු ව තිබිය යුතු ය. පාලකයා හා පාලිතයා අතර පැවැතිය යුතු සබඳතාව කොන්ෆියුසියස් ධර්මයෙන්

මනා ව පැහැදිලි කෙරේ. රටක ආර්ථික, සාමාජීය හා සදාචාරාත්මක දියුණුවක් ඇති කිරීම සඳහා ඉවහල් වන කරුණු සේ ම පාලකයකු සතු ව පැවැතිය යුතු මෛත්‍රී සහගතබව, නිහතමානිබව ආදි ගුණාංග ද ඉන් මනා ලෙස පැහැදිලි වේ.

ස්වභාව ධර්මය හා මිනිසාගේ පැවැත්ම අතර සමීප සබඳතාවක් ඇති බව එකල පිළිගැනුණි. සොබාදහමෙන් දායාද කර ඇති සම්පත් පරිභෝජනය කළ යුතු ආකාරය පිළිබඳ ව පැහැදිලි දර්ශනයක් කොන්ෆියුසියස් දහමෙන් ඉදිරි පත් විය. කෘෂිකර්මාන්තය මෙන් ම ව්‍යාපාර දියුණු කිරීමෙන් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වන උපදේශ මෙහි දී වැදැගත් වේ. කොන්ෆියුසියස්තුමා තම ඉගැන්වීම්වලින් සාමකාමී සමාජ දේශපාලන වාතාවරණයක් ගොඩනැගීමට අපේක්ෂා කළේ ය. මෙවැනි සාමකාමී වාතාවරණයක දී හැම දෙනා අතර ම මෛත්‍රී සහගත හැඟීම් මතු වේ. දරුවන් තම දෙ මාපියන්ටත්, දෙ මාපියන් තම දරුවන්ටත්, තමා තමාටත් ආදරය කරන්නා මෙන් සියල්ලෝ ම සියල්ලනට ආදරය කරති. පොදු හැඟීම් සියලු දෙනාට ම ඇති වේ. මෙවැනි තත්ත්වයක දී අනාචාර අපරාධකාරී තත්ත්ව ඇති නො වේ. කොන්ෆියුසියස්තුමාට අවශ්‍ය වූයේ කොන්ෆියුසියස් ධර්මයෙන් මෙවන් සාමකාමී නිදහස් සමාජයක් ඇති වනු දැකීම යි.

කොන්ෆියුසියස්තුමාගේ මරණින් පසු වසර සියයක කාලයක දී එතුමාගේ පළමු වැනි හා දෙ වැනි ශිෂ්‍ය පරම්පරා එතුමාගේ කියමන් හා එතුමා තම අනුගාමිකයන් සමඟ කළ සාකච්ඡා අන්තර්ගත කර 'lúnyu' නමින් ග්‍රන්ථයක් සම්පාදනය කර ඇත. මෙය කොන්ෆියුසියස්තුමාගේ සුභාෂිත කියමන් එකතුව ලෙස ද හැඳින්වේ. එහි සඳහන් සුභාෂිත වැකි අතුරින් උසස් පෙළ චීන භාෂා පාඨ සංග්‍රයෙහි දැක්වෙන කියමනක් මෙසේ ය.

"කොන්ෆියුසියස්තුමා මෙසේ පවසයි: යමෙක් ඉගෙන ගැනීමෙන් පසුව නැවත නැවත එය ප්‍රගුණ කරයි ද, එය සතුටට කාරණාවක් නොවෙයි ද! බොහෝ දුර සිට මිතුරන් පැමිණීම සතුටට කාරණාවක් නොවෙයි ද! මිනිසුන් තමන් නො දන්නා බව දැනගෙන තරහ නො ගන්නේ නම් එය මහත්මා ගුණයක් නොවේ ද!"[8]

## නිගමනය

මේ අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ චීනයේ බිහි වූ තාඕ දහම හා කොන්ෆියුසියස් දහම පිළිබඳ ව විග්‍රහාත්මක ව විමසීම යි. මිනිසා ප්‍රගුණ කළ සාර ධර්මත්, මනුෂ්‍යත්වයේ වැදැගත්කම පිළිබඳ හැඟීමත්, පෞද්ගලික සාර ධර්ම හා ගුණධර්ම වගාවත්, උසස් කොට සැලැකීම කොන්ෆියුසියස් දර්ශනයේ මූලිකාංග විය. යහපත් ගුණ ධර්ම වගාව මෙන් ම මිනිස් පරපුර සතු ව පිහිටිය යුතු අන්‍යෝන්‍ය සුබ සාධනය පිළිබඳ ගරුත්වය ද මේ ධර්මයේ සාරාත්මක අංගයක් විය. තාඕ දහමෙන් චීන දර්ශනයේ ස්වභාවික ගමන් මාර්ගය පිළිබිඹු විය. පුද්ගලයා හා සමාජය පිළිබඳ චර්යා ධර්ම පද්ධති හා සම්ප්‍රදාය ගොඩනැඟීම යන්න එකිනෙකා අතර ස්වභාව නියතියට පිටස්තර වූ කෘත්‍රිම සංස්කරණයකට පුද්ගලයා කොටු කර තැබීමක් බව එහි ඉගැන්වේ. විශාල වූ රාජ්‍යයක් පාලනය කිරීම වූකලි කුඩා මත්ස්‍යයකු පිසීම හා සමාන ව සරල වූවක් බව ලාඕත්සතුමා සදහන් කරයි. සැබෑ මුනිවරයකුගේ කාර්යය විය යුත්තේ තාඕ පදාර්ථය අවබෝධ කරගැනීමට මඟ පෙන්වීම යි. කොන්ෆියුසියස්තුමා තම ඉගැන්වීම්වලින් සාමකාමී සමාජ දේශපාලන වාතාවරණයක් ගොඩනැඟීම අපේක්ෂා කළේ ය.

මේ ආකාරයට කරුණු සලකා බැලීමේ දී චීනයේ බිහි වූ තාඕ දහමත්, කොන්ෆියුසියස් දහමත් චීන සමාජ සංස්ථාවේ බොහෝ වෙනස්කම් රැසක් සිදු කළ බව පෙනී යයි. ඉන් චීන ජනතාව අතර සහයෝගය, සහජීවනය හා පරාර්ථකාමීත්වය ඇති වූ අතර සමාජ සංස්ථාව තව තවත් සංවර්ධනය විය.

## ආන්තික සටහන්

[1] ගුණවර්ධන, 2008
[2] සුමනසිරි, 1999
[3] සුමනසිරි, 1999
[4] සුමනසිරි, 1999
[5] සුමනසිරි, 1999
[6] සුමනසිරි, 1999
[7] සුමනසිරි, 1999
[8] ධම්මදින්න, 2009

## මූලාශ්‍රය නාමාවලිය


ගුණවර්ධන, අමරදාස හා වෙනත් අය. (2008) **මහජන චීනය.** රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

**චීන භාෂා අධ්‍යයනය** - පළමු වැනි කලාපය. (2003) චීන භාෂා සංසදය. නූතන භාෂා අධ්‍යයන අංශය. කැලණිය විශ්වවිද්‍යාලය.

ධම්මදින්න හිමි, නැදලගමුවේ. (2009) **උසස් පෙළ චීන භාෂා පාඨ සංග්‍රහය.**

සුමනසිරි හිමි, ගල්ලෑල්ලේ. (1999) **සාම්ප්‍රදායික චීන ආගම්.** සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ.

http://www.thegreattao.com/html/introfounderlaotze.html, [Accessed on 12th July, 2012].

Dr. Sprunger, Meredith. **An Introduction to Confucianism**. http://urantiabook.org/archive/readers/601_confucianism.htm, [Accessed on 13th July, 2012].

http://en.wikipedia.org/wiki/Confucianism. [Accessed on 13th July, 2012].

http://en.wikipedia.org/wiki/Taoism. [Accessed on 14th July, 2012].

http://en.wikipedia.org/wiki/Tao_Te_Ching. [Accessed on 14th July, 2012].

http://www.travelchinaguide.com/intro/religion/confucianism/. [Accessed on 10th July, 2012].

http://www.travelchinaguide.com/intro/religion/taoism/. [Accessed on 10th July, 2012].